# මොරටුව මහා නගර සභාව

## 2021 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් සහ ව්‍යුහාත්මක ඉංජිනේරු සේවය/ උපදේශනාත්මක ඉංජිනේරු සේවාව සපයා ගැනීමට ලියාපදිංචි කිරීම.

2021 වර්ෂය වෙනුවෙන් මෙම මහා නගර සභාවේ මෙහි පහත දැක්වෙන මූල්‍ය අගයන් තුලට ගැනෙන කාණ්ඩ වල ව්‍යාපෘති/ කර්මාන්ත ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සඳහා ව්‍යුහාත්මක ඉංජිනේරු/ උපදේශනාත්මක ඉංජිනේරු සේවාව ලබාගැනීම සඳහා ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ගෙන් සහ මෙම සභාව මගින් සෘජු ශ්‍රමිකව දෙපාර්තමේන්තුව මගින් කර්මාන්ත/ ව්‍යාපෘති ඉටුකිරීමේදී අවශ්‍ය වන පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රමිකයින්ගේ ශ්‍රමය දෛනික කුලී පදනම මත සපයා ගැනීම සඳහා ශ්‍රමිකයින්ගෙන් හා සේවා සැපයුම්කරුවන්ගෙන් ඇතුලු මහා නගර සභා බල ප්‍රදේශය තුල අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම සඳහා උනන්දු කාරක කොන්ත්‍රාත්කරුවන්ගෙන් 2020.12.02 දින සිට 2020.12.23 වන දින පස්වරු 3.00 දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

2021 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් මෙම සභාවේ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන පුද්ගලයින් හෝ ආයතන ඒ සඳහා මෙම සභාව මගින් නොමිලයේ නිකුත් කරණු ලබන අයදුම්පත් ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කර හෝ තමන් විසින්ම අදාල සුදුසුකම් හා හැකියාවන් ඇතුලත්කර සකස් කරන ලද අයදුම්පතක් මගින් හෝ අදාල සියළු ලිපි ලේඛණ සමඟ නියමිත කාලය තුල මෙම සභාවට ඉදිරිපත් කල යුතුය.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහල වම් කෙලවරේ "කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2021" යනුවෙන් පැහැදිලිව සටහන් කර ලියාපදිංචි තැපැල මගින් හෝ අතින් ගෙනවිත් හෝ "නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව - මොරටුව" යන ලිපිනයට ලැබෙන සේ ලැබීමට සැලැස් විය යුතුය. නියමිත දින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරණු ලබන හෝ ලැබෙන හෝ අයදුම්පත් පිළිබඳව සලකා බැලීම සිදු නොකරනු ලබන අතර, තැපෑලේදී නැතිවන හෝ අස්ථානගතවන හෝ අයදුම්පත් සම්බන්ධයෙන් මෙම සභාව විසින් වග කියනු නොලැබේ. එසේම, ව්‍යුහාත්මක ඉංජිනේරු සේවාව සැපයීමට කැමැත්ත දක්වා සිටින ඉංජිනේරුවරුන් හා ආයතන විසින් ඉහත කී පරිදිම තම අයදුම්පත් මෙම සභාවට එවීමට කටයුතු කල යුතුය.

**කොන්ත්‍රාත් කාණ්ඩය**

1. මාර්ග, කාණු, ගොඩනැඟිලි සහ ක්‍රීඩා භූමි සකස් කිරීම් ආදී සිවිල් ඉංජිනේරු වැඩ සඳහා

| ලියාපදිංචි සීමාව | ලි.ප. ගාස්තු | | ICTAD(ලි.ප.) |
|---|---|---|---|
| රු.500,000.00 දක්වා | රු.4,000.00 | | |
| රු.1,000,000.00 දක්වා | රු.6,000.00 | + | (ICTAD-C-9) |
| රු.2,000,000.00 දක්වා | රු.7,500.00 | + | (ICTAD-C-9) |
| රු.4,000,000.00 දක්වා | රු.10,000.00 | + | (ICTAD-C-8) |

2. ආදාහනාගාර ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම්.

| ලියාපදිංචි සීමාව | ලි.ප. ගාස්තු | ICTAD(ලි.ප.) |
|---|---|---|
| රු.4,000,000.00 දක්වා | රු.4,000.00 | (ICTAD-C-8) |

3. ඇලුමිනියම් සහ වානේ පිරි සැකසුම් (Aluminum and Steel Fabrication) වැඩ ඉටුකිරීම හා එහි අලුත්වැඩියා සිදු කිරීම

| ලියාපදිංචි සීමාව | ලි.ප. ගාස්තු | ICTAD(ලි.ප.) |
|---|---|---|
| රු.4,000,000.00 දක්වා | රු.4,000.00 | (ICTAD-C-8) |

4. අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම.

| | ලි.ප. ගාස්තු |
|---|---|
| (සීමා පැනවීම් නැත) | රු.500.00 |

5. පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රමිකයන් (පෙදරේරු වැඩ, වඩු කාර්මික සහ කම්බි නැවුම්කරු/ Bar Bender) සැපයීම ලියාපදිංචි කිරීම.

| | ලි.ප. ගාස්තු |
|---|---|
| (සීමා පැනවීම් නැත) | රු.500 |

6. ව්‍යුහාත්මක ඉංජිනේරු සේවාව ලබා ගැනීම.
(ගොඩනැඟිලි හා ව්‍යුහාත්මක සැලසුම්, විස්තරාත්මක ඇස්තමේන්තු හා නිර්දේශ කිරීම ඇතුළු උපදේශනාත්මක සේවාව ලබා ගැනීම)

| **ලියාපදිංචි සීමාව** | **ලි.ප. ගාස්තු** |
|---|---|
| රු.4,000,000.00ට වැඩි ව්‍යාපෘති සඳහා | රු.5,000.00 |

**<u>කොන්දේසි හා නිර්ණායක</u>**

1. මෙම සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට හා ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ට අමතරව, පිටස්තර කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා ආයතන වලින් තත්කාලයේ පවතින අවශ්‍යතාවයන් මත ලංසු/ මිල සැඳහුම් කැඳවීම් හෝ කර්මාන්ත/ ව්‍යාපෘති හා සේවාවන් ඉටු කරවා ගැනීමේ අයිතිය සම්පූර්ණයෙන් සභාව සතුවේ.

2. මීට පෙර වර්ෂ වලදී මෙම සභාවේ කර්මාන්ත/ ව්‍යාපෘති සතුටුදායක ලෙස ඉටු කර භාර දීමට හෝ සම්පූර්ණ කර භාර දීමට අපොහොසත්වූ හෝ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවෙන් නම අපලේඛන ගත කරන ලද (Blacklisted) කොන්ත්‍රාත්කරුවන්ගේ හා ආයතන වල, සමාගම්වල ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. රු.1,000,000.00 සිට රු.4,000,000.00 දක්වා කර්මාන්ත/ ව්‍යාපෘති ඉටු කිරීම සඳහා මුල් වරට මෙම සභාවේ ලියාපදිංචි වන කොන්ත්‍රාත්කරුවන් හෝ ආයතන හෝ සමාගම් ඔවුන්ගේ හැකියාවන් හා සුදුසුකම් ඇතුළු පළපුරුදුකම් සනාථ කිරීමට අභ්‍යාස හා ඉදිකිරීම් සංවර්ධන ආයතනයේ (ICTAD) වලංගු ලියාපදිංචි සහතිකය සහ සමාගම් රෙජිස්ට්‍රාර් විසින් ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

4. රු.500,000.00 (රු.ලක්ෂ පහක්) සීමාව තුළ මුල් වරට ලියාපදිංචි වන අයදුම්කරුවන් තම සුදුසුකම් හා හැකියාවන් ඇතුළු පළපුරුදුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කළ යුතු අතර, (ICTAD) අභ්‍යාස හා ඉදිකිරීම් සංවර්ධන ආයතනයක් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එසේ වුවද, සමාගම් රෙජිස්ට්‍රාර් විසින් වයාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

5. මෙයට පෙර වර්ෂවල මෙම සභාවේ අවම ලියාපදිංචි සීමාව වන රු.500,000.00 සීමාව තුළ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් විසින් භාරගනු ලැබූ කර්මාන්ත/ ව්‍යාපෘති සතුටුදායකව හා සාර්ථක ලෙස ඉටු කර භාරදී ඇත්නම් ඔවුන්ට (ICTAD) ලියාපදිංචිය නොමැතිව ඔවුන් ලියාපදිංචි වූ අවම සීමාවේ සිට ඊළඟ ඉහළ සීමාව වන රු.1,000,000.00 සීමාව තුල ලියාපදිංචි වීමේ හැකියාව ඇත.

6. ව්‍යුහාත්මක ඉංජිනේරු සේවාව සැපයීම සඳහා ලියාපදිංචි වන ඉංජිනේරුවරුන් හා ආයතන ඔවුන්ගේ සුදුසුකම්, හැකියාවන් හා පළපුරුදුකම් පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.

7. ලියාපදිංචි වන ව්‍යුහාත්මක ඉංජිනේරුවරුන්ගේ හා ආයතනවලින් අදාළ සේවාව ලබාගැනීම සඳහා අවශ්‍යතාවයට අනුව උපදේශනාත්මක සේවාව සඳහා මිල ගණන් කැඳවනු ලබන අතර, අවම හෝ සාර්ථක මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සහ කාර්යය පැවරීමේ අයිතිය සම්පූර්ණයෙන්ම සභාව සතුවේ.

**2020.11.30** වන දින,
**මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය,**

**එස්.ඩී. තෙවරප්පෙරුම,**
**නාගරික කොමසාරිස්,**
**මොරටුව මහා නගර සභාව.**